Prepared by – K.S.Karunarathne
R/Sumana Balika Vidyalaya

නිපුණතාව 06 ඃ නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 6.4 ඃ විවිධ ප්‍රසංගයක් ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම් 6.4 ඃ සාමූහික ව විවිධ ප්‍රසංගයක් ඉදිරිපත් කරමු.

- **නිවැරදි පිළිතුරු තෝරන්න.**

1. විවිධ ප්‍රසංගයක් සංවිධානයේ දී මුලින් ම සිදු කළ යුතු කාර්යය වන්නේ,

(i). ආරාධනාපත් සැකසීම (ii). ගුරු සිසු සාකච්ඡාව හා කමිටු පත් කිරීම

(iii). සමරු කළඹ සැකසීම (iv). ආරාධනා කළ යුතු අය තෝරා ගැනීම

2. දිනය තීරණය කිරීමේ දී වැදගත් වන්නේ කුමක් ද?.

(i). සතිය මැද දිනයක්වීම (ii). සතිය පටන් ගන්නා දිනය

(iii). ඉදිරි දිනය නිවාඩු දිනයක්වීම (iv). නිවාඩු දිනයක් තෝරා ගැනීම

3. තෝරා ගන්නා නර්තනාංග අතර මින් නොගැළපෙන්නේ .

(i). අස්නෙ නැටීම (ii). තෙල්මේ නැටීම (iii). මල් පදය නැටීම (iv). දරු නැළවිලි කවියක් ගායනය

4. ආරාධනාපත් සැකසීමේ කමිටුවට දෙවනුව පැවරී ඇති වගකීම,

(i). දිනය, ස්ථානය හා වේලාව තෝරා ගැනීම (ii). ආරාධනාපත් බෙදීම හා නාම ලේඛන සැකසීම

(iii). කල් ඇතිව ආරාධනාපත්‍ර මුද්‍රණය (iv). එය අනුමත කරවා ගැනීම

5. ''ඩමියක්'' යන්නෙන් අදහස් කරන්නේ ,

(i). ආකෘතියකි (ii). පිටපතකි (iii). ඡායාපිටපතකි (iv). කටු සටහනකි

- **හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .**

6. පොල්තෙල් පහන සැකසීමේ දී ................................................හා ආරාධිතයින් සංඛ්‍යාව ගැන සැලකිලිමත් විය යුතු ය.

7. මුලින් වේගවත්බව අඩු නර්තනාංග යොදා පසුවට ..................................................යෙදීම සුදුසු ය.

8. ප්‍රසංගය පැවැත්වෙන අවස්ථාවේ එය වර්ණවත් කර ගැනීමට.................................................මහෝපකාරී වේ.

9. සංදර්ශනයක ජීවය පවතින්නේ ...................................................කාර්යක්ෂමතාව මත වේ.

10. විවිධ ප්‍රසංගයේ සියලු කාර්යය අවසන් වූ පසු ක්‍රම සම්පාදන කමිටුව සිදු කළ යුතු කාර්යයකි .........................
.............................................................................. කිරීම.

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

11. විවිධ ප්‍රසංගයට ගැලපෙන සාම්ප්‍රදායික නර්තනාංග 6ක් නම් කරන්න.
12. විවිධ ප්‍රසංගයක සැලැස්ම කෙටියෙන් ලියන්න.
13. ඔබ දැක ඇති විවිධ ප්‍රසංගයක් පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වන්න.
14. විවිධ ප්‍රසංගයක් සඳහා සුදුසු තේමාවක් නම් කර ඊට උචිත පරිදි නර්තන, ගායන, වාදන අංග පෙළගස්වන්න.